ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1136 - මුල් ළමාවිය ආයතන සහ ප්‍රාථමික පාසල් කළමනාකරණය**

කාලය - පැය දෙකයි.

---

දිනය - 2007.12.16 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01. i. ඉගෙනුම් පරිසරය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පෙර පාසල් ඉගෙනුම් පරිසරය ඵලදායී ලෙස සැලසුම් කරන අන්දම උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. i. 'කළමනාකරණය' යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. පෙර පාසලේදී හෝ ප්‍රාථමික පාසැලේදී ගුරුවරයෙකු වශයෙන් ඔබ කාලය කළමනාකරණය කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 10)

iii. පෙර පාසල්/ප්‍රාථමික පාසල් සන්දර්භය තුළ කළමනාකරණය පිළිබඳ දැනුම තුළින් ගුරුවරයෙකුට ලබාගත හැකි එක් වාසියක් විස්තර කරන්න. (ලකුණු 10)

03. i. ජීන් පියාජේ විසින් ඉදිරිපත් කරන ලද සදාචාර සංවර්ධන අවධි දක්වන්න. (ලකුණු 03)

ii. ළමයින්ගේ සදාචාර සහ සමාජීය සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රාථමික පාසැල්වලට පැවරෙන වගකීම පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii. පෙර පාසැල් ළමයින් තුළ සමාජීය දක්ෂතා වර්ධනය කළ හැකි ක්‍රියාකාරකමක් විස්තර කරන්න. (ලකුණු 10)

04. i. කාර්යක්ෂම ලෙස ප්‍රාථමික පාසැලක් පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය සම්පත් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

ii. ප්‍රාථමික පාසැලකට මූල්‍ය සම්පත් ලබාගත හැකි ආකාර පහක් (05) දක්වන්න.

(ලකුණු 05)

iii. පෙර පාසැලක අරමුණු ඉටුකර ගැනීමට හැකිවන ලෙස පාරිසරික සම්පත් කළමනාකරණය කරන අයුරු උදාහරණ (03) ක් දක්වමින් පැහැදිළි කරන්න.

(ලකුණු 15)

05. i. පෙර පාසැලක් පිහිටුවීමට ඉඩමක් තෝරා ගැනීමේදී සැලකිල්ලට ගතයුතු අංශ දක්වන්න.

(ලකුණු 05)

ii. පෙර පාසැලක දෛනික වැඩ සටහනක ඇතුළත් විය යුතු අංග ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05)

iii. ගුරුවරයෙකු ළමුන්ගේ ප්‍රගතිය තක්සේරු කරන අයුරු උදාහරණ දක්වමින් පැහැදිළි කරන්න.

(ලකුණු 15)

06. පහත සඳහන් මාතෘකා දෙකක් (02) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය

ii. ප්‍රාථමික පාසල්වල ගෘහස්ත ඉගෙනුම් පරිසරය කළමනාකරණය

iii. පෙර පාසල්/ප්‍රාථමික පාසැල් මුල් ගුරුවර/වරියකගේ කළමනාකරණ කුසලතා

iv. පෙර පාසලකට ප්‍රජා සම්පත් වලින් ලැබිය හැකි ප්‍රයෝජන

(ලකුණු $12\frac{1}{2} \times 2 = 25$ )

- හිමිකම් ඇවිරිණි. -

LANKA ★ OPEN
LIBRARY